# ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකේය කලා කරුවන් ගේ නාමාවලිය ගොඩනැගෙයි

## ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකේය කලා කරුවනට වෙන් වූ වෙබ් අඩවියක්

ශ්‍රී ලංකාවෙන් ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ පළමු පරම්පරාවේ අයවලුන්ගේ සිට නූතන පරපුර දක්වා මෙහි ජීවත්වෙමින් ඔස්ට්‍රේලියානු සමාජයට අනුගත වූ අපේ ඇත්තෝ තමන්ගේ උපන් හැකියාවන් තුලින් හා තමන් දැන උගත් ශිල්ප ඥානයෙන් ශ්‍රී ලාංකේය කලාවට හා සංස්කෘතියට නේක අයුරින් දායක වීමට ඉඩ ප්‍රස්ථා වෙන් කර ගත්තෝය. කාලය සමග සටන් කරමින් ජීවන අරගලයක යෙදෙන සමාජයක තම ජන කොට්ඨාශය වෙනුවෙන් කිසියම් හෝ නිර්මාණයක් දායක කිරීමට තම කාලයත් ශ්‍රමයත් වැය කිරීමට ඉදිරිපත් වන මෙම ගෞරවනීය පුද්ගලයන් අප සමාජය තුළ නිසි අගැයීමට භාජනය වන්නේ ද යන්න විමසා බැලිය යුතු කරුණකි. ඉනිදු මදක් ඔබ්බට ගිය කළ ඔස්ට්‍රේලියානු බහු සංස්කෘතික සමාජයේ උන්නතිය හා විවිධත්වය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලාංකේය සංස්කෘතික නිර්මාණ මෙම සමාජයට දායක කරන අප කලාකරුවන් ඔස්ට්‍රේලියානු සමාජය තුළ කොතරම් දුරට අගය කිරීමකට ලක් වන්නේ ද යන්න ගැටලු සහගතය ිග එවැන්නක් ගැන කිසියම් බලාපොරොත්තුවක් හෝ තැබීමට නම් අප කලාකරුවන්ගේ නිර්මාණ හා ඔවුන් කරන නිහඬ සේවය අප සමාජයෙන් ඔබ්බට ගෙන යාම අවශ්‍ය වේ.

අපේ මව්බිමේ ගහකොල සතා සීපාවා මෙන්ම මානව ගුණාංගයන් ගති පැවතුම් සිරිත්විරිත් අප සිත්සතන් තුළට සමීප කරවන්නේ මෙම නිර්මාණ ශිල්පීන් ය. සිංහල පොතක් පත්තරයක් කියවන්නට සිංහල නාට්‍යයක කවියක ගීතයක පදබැඳුමක තනුවක රස විඳින්නට අප කොතරම් ලොල් වන්නේද යන්න අමුතුවෙන් කිව යුතු නැත . එවන් නිර්මාණ අපටය දායක කරන අප සහෘදයන්ගේ නිර්මාණ රස විඳීම පමණක් නොව අනාගත පරපුර සඳහා ඒවා සජීවී ලෙස සුරක්ෂිතව තැබීමද අප සතු යුතුකමක් වන්නේ ය.

ඕනෑම අග්‍රගණ්‍ය ගායකයෙකුට සංගීතය පැසයිය හැකි සංගීතඥයෝ මෙහි සිටිති. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි නාලිකාවන්ට නොදෙවෙනි වෙමින් එම සේවාවන් මෙහි පවත්වාගෙන යන දක්ෂ ගුවන් විදුලි ශිල්පීන් ශිල්පිනියන් මෙහි විරල නැත. නරඹන්නන්ට ලයනල් වෙන්ඩ්ට් රඟහල සිහිපත් කරවන නාට්‍ය ඉදිරිපත් කරන්නට මෙහි නාට්‍ය කරුවෝ සමත් වෙති. මෙහි වෙසෙන ගත් කරුවෝ විටින් විට තම නිර්මාණ එළි දක්වති. මේ රටෙන් බිහිවූ ගායක ගායිකාවෝ රැසකි. මේ අතර උඩරට පහතරට නැටුම් හා බෙර වාදන ආදියෙන් දස්කම් දක්වන්නෝ බෝහෝ ය. මේ සියල්ල කැටි කොට ගත් කළ මේ සා කාලයක් තිස්සේ ඔස්ට්‍රේලියානු බහු සංස්කෘතික සමාජයට කොතරම් වූ කලා නිර්මාණ රැසක් ශ්‍රී ලාංකිකයන් විසින් දායක කරනු ලැබ තිබේ ද?

මෙම නිර්මාණ පිළබඳ තොරතුරු එකිනෙකා අතර බෙදා හදා ගැනීමට ඉඩසැළසීමත් අපේ ඇත්තන්ගේ හපන්කම් පිළිබඳ විත්ති විශ්ව ගම්මානය කරා ගෙන යාමත් අරමුණු කරගෙන අප කලාකරුවන් වෙනුවෙන් වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වොගෙන යාම සඳහා ව්‍යපෘතියක්

ඔස්ට්‍රේලියාවේ සංස්කෘතික හා සමාජීය පදනම හෙවත් ෆෝකස් පදනම නැමැති සංවිධානය විසින් දියත් කරනු ලැබ ඇත . ඔස්ට්‍රේලියානු ප්‍රාන්ත රජයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය මගින් සංගීතය නැටුම් නාට්‍ය රංගනය ගායනයල සංස්කරණයල නිවේදනයල ග්‍රන්ථකරණයල කවි රචනයල පුවත්පත් කලාවල පිටපත් රචනයල ඡායාරූපකරණයල වීඩියෝකරණය වැනි පුළුල් අංශ රැසක් ඔස්සේ සමාජ මෙහෙවරක නිරතවන අප නිර්මාණකරුවන්ගේ තොරතුරු සහ ඔවුන්ගේ නිර්මාණ ඇතුළත් වෙබ් අඩවියක් සජීවී දත්ත පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කෙරනු ඇත . මෙම වෙබ් අඩවිය මගින් එම කලාකරුවන් අතර සහ සමාජය අතර සන්නිවේදනය පහසු වීම හේතුවෙන් නව ව්‍යාපෘති ඇරඹීමටද ඉඩ ප්‍රස්ථා ඇරඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ .

ඔස්ට්‍රේලියාවේ වෙසෙනෙ සියලුම කලා නිර්මාණ ශිල්පීන්ට මෙම වෙබ් අඩවියට සම්බන්ධ වන මෙන් ෆෝකස් පදනම ගෞරවයෙන් ආරාධනා කරයි. මෙම වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා ඔබේ තොරතුරු ෆෝකස් සංවිධානය වෙත ලබාදීම අවශ්‍ය වේ. එහි ඔබේ තොරතුරු ඇතුළත් පිටුවට ඔබේ නිර්මාණ සීඩී තැටි ඡායාරූප වැනි ආකාර වලින් ඇතුළත් කල හැකි ය. මේ සඳහා සකස් කොට ඇති ආකෘති පත්‍රය මෙහි වෙසෙන සියළුම් නිර්මාණ කරුවන් වෙත එවීමට සංගමය බලාපොරාත්තු වෙයි. ඔබ නිර්මාණකරණයේ යෙදෙන්නේ නම් ඔබේ ලිපිනය සහ ඔබ දන්නා අනෙකුත් නිර්මාණකරුවන්ගේ ලිපිනයන් පහත දුරතකයට හෝ පහත ලිපිනයට ෆෝකස් සංවිධානය වෙත යොමු කිරීමෙන් මෙම ව්‍යාපෘතියට සහය වන මෙන් එම සංවිධානය ඔබෙන් ඉල්ලා සිටියි.

ලිපිනය
FOCAS Foundation
1/51 Srorey Road
Reservoir
Vic 3073

Tel - 90777086/94025380
emai - focas.foundation@gmail.com

ශ්‍රියාණි ජයවික්‍රම මද්දුමගේ
Public Officer
FOCAS Foundation

25 වන පිටෙන්

මේජර් රමණී කාංගරආරච්චි මෙසේ දක්වා ඇත.

විසි දෑ වසරකට පෙර දී
මව් තුරුලේ කිරි බොනවිට
යුධ බිම වෙත යාවි කියා
හිතුවද නුඹ රූපවතී...........

යොවුන් වසන්තය නුඹගේ
උතුරු කරේ බංකරයක
ගතවේ යයි හීනෙන්වත්
හිතුවද නුඹ රූපවතී...........

රුපුනොද බිඳ ජයගන්නට
යුධ පෙරමුණ වෙත යන්නට
කකියන ලේ සිරුර පුරා
දිව්වද නුඹෙ රූපවතී...........

ජාතියේම ප්‍රණාමයක්
පිළිගන්නට ප්‍රතිමාවක්
කවදා හෝ නුඹේ නමින්
ඉදිවේවිද රූපවතී...........

තවත් කවි ලියා ඔබේ දෑස් කඳුලින් බර කිරීමට මම අදහස් නොකරමි. එසේ මියගිය වීරෝධාර සෙබළියන්ගේ දරු පවුල්වලටත්, ආබාධිත වූ අයගේ දරු පවුල්වලටත්, විශ්‍රාමික අනෙකුත් සෙබළියන්ගේ අනාගත සුභ සාධනය සඳහාත්, එකී කාන්තා සෙබළ බලකා සංගමය දියත් කර ඇති ව්‍යපෘති වෙනුවෙන් හා ඊට ආධාර පිණිස ලබන මාර්තු මස 9 වන ඉරුදින සවස 2.30ට හා 6.30ට වික්ටෝරියා බර්වුඩ්හි ස්ටේෂන් ස්ට්‍රීට් අංක 87 දරණ ස්ථානයේ පිහිටි -බිසන් සෙන්ටර්" ශලාවේදී (මෙල්වේ අංක. 61 සී 5), මෙල්බර්න් දක්‍ෂ කලා කරුවන් හා විශ්‍රාමික සෙබළියන්ගේ සහභාගීත්වයෙන් විවිධ ප්‍රසංගයක් පැවැත්වීමට වික්ටෝරියාවේ පිළිසරණ සංගමය විධිවිධාන සළසා ඇත.

තවද මෙල්බර්න් ශ්‍රී ලංකා සංස්කෘතික හා ප්‍රජා සේවා පදනමේ සහයෝගයත් ආධාරයත් මෙම පුණ්‍ය කටයුත්ත සඳහා පිරිනමන එහි ගරු සභාපති වෛද්‍ය ඔල්ගා මෙන්ඩිස් මහත්මිය විසින් දන්වා ඇත. මෙල්බර්න් ශ්‍රී ලාංකික දේශ හිතෛශී රසික ඔබ සැමගේ ආධාරයත් සහභාගිත්වයත් පිළිසරණ සංගමය ඉතාමත් ගෞරවයෙන් බලාපොරොත්තු වෙයි. එය ශ්‍රී ලංකා රණ ලියන්ට ඔබ අප සැමගෙන් පිදෙන තිළිණයයි.

